**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව -2018**

අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්

1. මේ සමග අමුණා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට 2017. 12. 30 දින හෝ ඊට පෙර ලැබෙන සේ **පාඨමාලා සමායෝජක, බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම් පත්‍ර කිසිඳු හේතුවක් නිසා හෝ සලකා බලනු නොලැබේ.
2. අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයන් හයක් සම්මාන තුනක් සහිතව සමත්වීම හෝ එයට සමාන විභාගයකින් සම්මාන තුනක් සහිතව විෂය හයකින් සමත්වීම අවම සුදුසුකම වේ.
3. පාඨමාලාව සඳහා අපේක්ෂිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපතක් ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය.
4. පාඨමාලාව සඳහා ඇතුළත් කර ගැනීම සලකා බැලීමට අපේක්ෂිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ අවශ්‍යය අවස්ථාවක දී ඉදිරිපත් කළ යුතුය.
5. ඔබගේ අයදුම් පත්‍රය අනුව අදාළ පාඨමාලාව සඳහා ඔබ තෝරා ගනු ලැබුවහොත් ඒ බව ඔබට පෞද්ගලිකව දන්වනු ලබන අතර, පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ඒ අනුවය. (අදාල ගෙවීම් ආපසු ගෙවීම් කරනු නොලැබේ.)
6. 2018 පෙබරවාරි මාසයේදී පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලැබේ.
7. පාඨමාලා ගාස්තු :-

| | | |
|---|---|---|
| ලියාපදිංචිය හා අයදුම්පත් ගාස්තු | :- | රු. 350.00 |
| පාඨමාලා ගාස්තු | :- | රු. 20000.00 |
| විභාග ගාස්තු | :- | රු. 1000.00 |